

# ජලය ජීවිතය හා මරණය පිළිබඳ කරුණක්

* ජලය ජීවිතයට අත්‍යාවශ්‍ය සම්පතකි. ඊට ආදේශකයක් නැත.

* පෘථිවියෙන් සියයට 70 ක් වැසී ඇත්තේ ජලයෙනි. ඉන් සියයට 97.5 ක් ලවණ ජලයයි. ඉතිරි සියයට 2.5 කඨින ජලයයි. ඉන් හතරෙන් තුනක් අයිස්පර ස්වරූපයෙන් පවතී.

* බිලියන 1.1 ක් (කෝටි 110 ක්) දෙනාට, දළ වශයෙන් ලෝක ජනගහණයෙන් හයෙන් එකකට පවිත්‍ර ජලය නොලැබේ. බිලියන 2.4 ක් (කෝටි 240 ක්) දෙනාට, එනම් ලෝක ජනගහණයෙන් සියයට 40 කට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නැත.

* දිනෙන් දිනම ලොව පුරා ජලය හිඟ වෙමින් පවතී. උතුරු අප්‍රිකාවේ සහ බටහිර සහ දකුණු ආසියාවේ තත්වය වඩා උග්‍රය. වසර 2025 වන විට ලෝක ජනගහණයෙන් තුනෙන් දෙකක් පමණ බිලියන 5.5 ක් (කෝටි 550 ක්) පමණ - ජල හිඟයෙන් පීඩා විඳිනු ඇත.

* අනාරක්ෂිත ජලය සහ අසතුටුදායක සනීපාරක්ෂාව නිසා ඇති වන ලෙඩ රෝග වලින් සෑම දිනකම ළමයි 6,000 ක් පමණ මරුට බිලි වෙති. සෑම වසරකම මෙබඳු රෝග වලට ගොදුරු වන ජන සංඛ්‍යාව මිලියන 250 ක් (කෝටි 25 ක්) ඉක්මවයි.

* සංවර්ධනය වන රටවල සියළු රෝගාබාධා වලින් සියයට 80 කට හේතුව අනාරක්ෂිත ජලය සහ සනීපාරක්ෂාවයි.

* පසුගිය ශත වර්ෂයේදී ජල පරිභෝජනය හය ගුණයකින් වැඩි විය - එය ජනගහණ වර්ධන අනුපාතය මෙන් දෙගුණයකට වැඩිය.

* ජල හිඟයෙන් වඩාත් පීඩා විඳින්නෝ ස්ත්‍රීහු හා ගැහැණු ළමයි වෙති. බොහෝ ගම්බද ප්‍රදේශ වල ස්ත්‍රීන්ට හා ගැහැණු ළමයින්ට ජලය සොයා සැතපුම් ගණන් ඇවිද යාමට සිදුවේ.

* මුළු මිරිදිය ජල ස්කන්ධයෙන් සියයට 70 ක් පමණ කෘෂිකර්මය සඳහා භාවිතා කෙරේ. අකාර්යක්ෂම වාරිකර්ම නිසා - විශේෂයෙන් සංවර්ධනය වන රටවල ඉන් සියයට 60 ක් වාෂ්ප වී යයි. නැතහොත් ගංගා වෙත හෝ භූගත ජලනිධි වෙත හෝ ආපසු ගලා යයි.

* 1960 න් පසු වාරි ජල පරිහරණය සියයට 60 කින් ඉහළ ගොස් තිබේ.

* කාන්දුවීම් නීති විරෝධීජල සම්බන්ධතා සහ නාස්තිය නිසා අපතේ යන ජල ප්‍රමාණය සංවර්ධනය වන රටවල පානය සඳහා භාවිත ජලයෙන් සියයට 50 කි.

* ප්‍රයෝජනයට ගත නොහැකි අයුරින් ජලය අපවිත්‍ර වීම වැඩි වන වේගයකින් සිදු වෙමින් පවතී. මිරිදිය පරිසර පද්ධති අතිශයෙන් දූෂ්‍ය වී ඇත. ලෝකයේ තෙත් බිම් වලින් අඩක් නැතිව ගොසිනි. ලොව හඳුනා ගත් මිරිදිය ජීවින් දස දහසෙන් සියයට 20 ක් වඳ වී ගොස් ඇත.

* එක්සත් ජනපදය, චීනය සහ ඉන්දියාව වැනි රටවල භූගත ජල පරිභෝජනය ප්‍රතිපූර්ණ වේගය ඉක්මවා ගොස් ඇත-භූගත ජල මට්ටම වේගයෙන් පහත වැටෙමින් තිබේ. බටහිර ඇමෙරිකාවේ කොලරාඩෝ ගංගාව සහ චීනයේ කහ ගඟ වැනි ගංගා මුහුදට ළඟා වීමට පෙර බොහෝ විට සිඳී යයි.

### අන්තර් ජාතික මිරිදිය වර්ෂය

* 1990 දශකයේදී සංවර්ධනය වන රටවල මිලියන 835 ක් (අසූ තුන් කෝටි පනස් ලක්ෂයක්) ජනයා ආරක්ෂිත පානීය ජල පහසුව ලැබූහ. මිලියන 784 ක් (78 කෝටි හතලිස් ලක්ෂයක්) දෙනාට සනීපාරක්ෂක පහසුකම් ලැබිණ.

* සංවර්ධනය වන රටවල ජල සැපයුම හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම පිණිස වසරකට වැය කළ යුතු මුදල ඩොලර් බිලියන 20 කි. (කෝටි 2,000 කි.)


* එහෙත් මේ රටවල දැනට වැය කෙරෙන්නේ වසරකට ඩොලර් බිලියන 10 ක් (කෝටි 1,000) පමණිි.

* උග්‍ර වන ජල හිඟය හමුවේ ජල කළමනාකරණය වැඩි දියුණු කළ යුතු බවට පොදු එකඟත්වයක් ඇත. එය කළ යුත්තේ කෙසේද යන්න ගැන විවාදයක් පවතී. එක් මතයකට අනුව පිරිසිදු පානීය ජලය මානව අයිතියකි. එය සපුරා ලීමට රජය බැඳී සිටී. අනෙක් මතය අනුව ජලය ආර්ථික භාණ්ඩයකි. එබැවින් ජල සැපයුම වෙළෙඳ පොළ යාන්ත්‍රණය මගින් පාලනය කළ යුතුය. පෞද්ගලිකරණය එහි අත්‍යාවශ්‍ය අංගයකි.


ප්‍රභවය - එක්සත් ජාතීන්ගේ තොරතුරු මධ්‍යස්ථානය











# 2003 අන්තර් ජාතික මිරිදිය වර්ෂය

2003 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් "අන්තර්ජාතික මිරිදිය වසර" ලෙස නම් කොට තිබේ. පෘථිවි වාසීන්ගේ ජීවිතය කෙරෙහි ජල සම්පත් වල ඇති කේන්ද්‍රීය වැදගත්කම සහ උග්‍රවන ජල හිඟය සැලකිල්ලට ගෙන මේ පියවර ගනු ලැබිය. ධරණීය පදනමක් මත මිරිදිය සම්පත් පරිහරණය, කළමණාකරණය හා රැක ගැනීම පිණිස සියළු දෙනා යොමු කිරීමත් එහිලා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග තහවුරු කොට වැඩි දියුණු කිරීමත් ජල වසරක් ප්‍රකාශයට පත් කිරීමේ අරමුණ වන්නේ ය.

මූලික මානව අවශ්‍යතා සපුරා ගැනීම සඳහාත් සෞඛ්‍යය හා ආහාර නිෂ්පාදනය සහ පරිසර පද්ධතීන් රැක ගැනීම සඳහාත් මිරිදිය සම්පත් වල ඇති අත්‍යවශ්‍ය වැදගත්කම පිළිබඳ අවබෝධය නැංවීම පිණිස ජල වසර උපයෝගී කර ගන්නැ' යි මහා මණ්ඩල යෝජනාව සියලු සාමාජික රාජ්‍යයන්ගෙන්, එක්සත් ජාතීන්ගේ ආයතන වලින් සහ සෙසු ප්‍රධාන පෙලේ කණ්ඩායම් වලින් ඉල්ලා සිටී. එය සියළු මනුෂ්‍යයන්ගේ සමස්ථ, ආර්ථික, සමාජ සංවර්ධනය පිණිස ධරණීය රටාවකින් මිරිදිය සැපයුම පරිහරණය කිරීමේ අවශ්‍යතාව හුවා දක්වයි. ලෝකයේ බොහෝ ප්‍රදේශ විශේෂයෙන් සංවර්ධනය වන රටවල් මුහුණ පා ඇති උග්‍ර ජල ගැටළු වලට ඉහළ ප්‍රමුඛත්වය දෙමින් ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටම් වලින් අවශ්‍ය පියවර ගන්නා ලෙස ද, යෝජනාව සාමාජික රටවලින් ඉල්ලා සිටී.

මිරිදිය, පෘථිවිය මත ජිවිතයේ පැවැත්මට අත්‍යවශ්‍ය සම්පතකි. ඊට ආදේශකයක් නැත. සංවර්ධනය වන රටවල ලෙඩ රෝග අඩු කිරීම සහ ජීවිත රැක ගැනීම සඳහා සියලු දෙනාට පානීය ජලය සහ ප්‍රමාණවත් සනීපාරක්ෂාව සැපයීම තරම් වැදගත් වෙනත් තනි ක්‍රියා මාර්ගයක් නැතැ යි එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් සඳහන් කරයි. අද ලෝකයේ ජල ඉල්ලුම, සැපයුම ප්‍රතිපූරණය කළ හැකි වේගය ඉක්මවා වැඩි වෙමින් පවතී. ජල හිඟය නව සහස්‍රකයේ ලෝකය මුහුණ දෙන ප්‍රධානතම ගැටලු දෙකෙන් එකක් ලෙස රටවල් 50 කට අයත් විද්‍යාඥයින් 200 කින් සමන්විත එක්සත් ජාතීන්ගේ කමිටුවක් විසින් 1999 දී හඳුනා ගන්නා ලදී. දැනටමත් සිය කෝටියකට අධික ජනයාට පවිත්‍ර ජල පහසුව නැත. දළ වශයෙන් කෝටි 250ක් දෙනාට, එනම් ලෝක ජනගහනයෙන් සියයට 40 කට විධිමත් සනීපාරක්ෂක පහසුකම් නොලැබේ. අපවිත්‍ර ජලය නිසි සනීපාරක්ෂාව නොලැබීම නිසා සෑම දිනකම ළමයි 6,000ක් පමණ මිය යති. වසර 2025 වන විට ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් - කෝටි 550ක් පමණ - ජල හිඟයෙන් පීඩිත ප්‍රදේශවල ජීවත් වනු ඇතැයි ගණන් බලා තිබේ.

මේ අභියෝගය ජය ගනු පිණිස මග පෙන්වීම සහ අවශ්‍ය පියවර ගැනීම සඳහා අන්තර්ජාතික මට්ටමින් වැදගත් ඉලක්ක ගණනාවක් නියම කොට තිබේ. වසර 2015 වන විට පානීය ජල පහසුව නැති ජන සංඛ්‍යාව අඩකින් අඩු කිරීමට එක්සත් ජාතීන්ගේ සහස්‍රක සමුළුවට එක් වූ ලෝක නායකයෝ එකඟ වූහ. 2002 ජොහැන්නස්බර්ග් නායක සමුළුවේ දී එකී අධිෂ්ඨානය නැවත සපත කළ ඔව්හු වසර 2015 වන විට මූලික සනීපාරක්ෂක පහසුකම් නැති පිරිස අඩකින් අඩු කිරීමේ ඉලක්කයක් ද ඊට එක් කළහ. වසර 2005 වන විට ජාතික ජල කළමණාකරණ සහ කාර්යක්ෂමතා සැලසුම් සම්පාදනය කිරීමට ද ඔව්හු එකඟත්වය පළ කළහ.



